# නැගෙනහිර පළාත් සභාවේ විනය පරීක්ෂණ නිලධාරි සංචිතය සඳහා අයදුම්පත් කැඳවීම

ආයතන සංග්‍රහයෙහි XLVII සහ XLVIII යන පරිච්ඡේදයන්හි පළමු උපලේඛනයෙහි සඳහන් වන වැරදි සම්බන්ධයෙන් නැගෙනහිර පළාත් සභාවේ විනය පරීක්ෂණ නිලධාරි සංචිතය සඳහා ලියාපදිංචි වීමට උනන්දුව දක්වන සුදුසුකම් සහිත රජයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන 2024.08.07 දිනට පහත දක්වා ඇති සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සුදුසුකම් (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2010)**

**විශ්‍රාමික නිලධාරීන් සඳහා :**

- ආයතන සංග්‍රහයෙහි පළමු උපලේඛනය යටතේ කිසිදු අවස්ථාවක දඬුවමකට යටත් නොකරන ලද නිලධාරියෙකු වීම හෝ ආයතන සංග්‍රහයෙහි දෙවන උපලේඛනය යටතේ සඳහන් වරදක් සිදුකිරීමෙන් පසුව වසර 5 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.
- රාජ්‍ය සේවයේ මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක වසර පහක සේවයක් සම්පූර්ණ කර තිබීම.
- 2024.08.07 දිනට වයස 70 ට අඩු විය යුතුය.

විශ්‍රාමික නිලධාරීන් තම අයදුම්පත සමග විශ්‍රාම ගැනීම අනුමත කිරීමේ ලිපියෙහි පිටපතක් හා විශ්‍රාම වැටුප් ප්‍රදාන ලිපියෙහි පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

**සේවයෙහි යෙදී සිටින නිලධාරීන් සඳහා :**

- තම සේවා කාලය තුළ ආයතන සංග්‍රහයෙහි පළමු උපලේඛනය යටතේ කිසිදු අවස්ථාවක දඬුවමකට යටත් නොකරන ලද නිලධාරියෙකු වීම හෝ ආයතන සංග්‍රහයෙහි දෙවන උපලේඛනය යටතේ සඳහන් වරදක් සිදුකිරීමෙන් පසුව වසර 5 ක සතුටුදායක සේවයක් සම්පූර්ණ කර ඇති නිලධාරියෙකු වීම.
- සේවයෙහි ස්ථිර කර තිබිය යුතුය.

**නීතිඥවරුන් සඳහා :**

- අධිකරණ සේවයේ වසර 10 ක සේවයක් සම්පූර්ණ කර තිබීම.
- 2024.08.07 දිනට වයස 70 ට අඩු විය යුතුය.

රාජකාරි ප්‍රදේශය : නැගෙනහිර පළාත
ගෙවීම් : රා.ප.ච. 18/2018
අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය : 2024.08.07
අයදුම්පත් යොමු කළ යුතු ලිපිනය : නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන)
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන) කාර්යාලය - නැ.ප.
කන්නියා පාර, වරෝදයනගර්,
ත්‍රිකුණාමලය හෝ
dcsadmofcep02@gmail.com යන විද්‍යුත් ලිපිනයට යොමු කරන්න.

**අයදුම්පත තැපෑලෙන් එවන්නේනම් :**

ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි 'විනය පරීක්ෂණ නිලධාරි සංචිතය සඳහා ලියාපදිංචි වීම' යනුවෙන්ද,

**අයදුම්පත විද්‍යුත් ලිපිනයෙන් යොමු කරන්නේනම් :**

විද්‍යුත් ලිපියෙහි මාතෘකාව වශයෙන් 'විනය පරීක්ෂණ නිලධාරි සංචිතය සඳහා ලියාපදිංචි වීම' සඳහන් කරන්න.
විශ්‍රාම ගැනීම අනුමත කිරීමේ ලිපියෙහි හා විශ්‍රාම වැටුප් ප්‍රදාන ලිපියෙහි ස්කෑන් පිටපත් අමුණා එවන්න. ඔබගේ ඩිජිටල් අත්සන භාවිතා කරන්න.

ප්‍රධාන ලේකම්ගේ තීරණය අවසන් තීරණය වේ.